# දළදා මාළිගාවෙන් පාණදුරා වාදයට

මේ ලිපියට නිමිත්ත වන්නේ මනෝජ් අබයදීර මහතා විසින් දළදා මාළිගාව සම්බන්ධයෙන් ලියන ලද ලිපි දෙකකි. ඒ ලිපිවලින් කියැවෙන්නේ දළදා මාළිගාවේ කටයුතුවලට එරෙහිව සිදුවන්නේ යැයි කියන, ක්‍රිස්තියානි සංවිධානයක හෝ සංවිධාන වල කුමන්ත්‍රණයකි. එයට මහාචාර්ය වේශයෙන් සිටින අයකුද ඈතුළුව බෞද්ධයන්ද මුදලට ගෙන ඇතැයි කියැවෙයි. මේ පිළිබඳ සොයා බලා වරදකරුවන් ඇතොත් නිසි දඬුවම් දීමට පියවර ගත යුතුය. එහෙත් ඒ වාක්‍යය ලියූ වහාම සිහියට නැගෙන්නේ එසේ පියවර ගන්නේ කවුද යන්නය. ඒ සඳහා මැදිහත් වන්නේ කවුද? ආණ්ඩුවද? පොලිසියද? නීතිපති දෙපාර්තමේන්තුවද? බුද්ධ ශාසන අමාත්‍යාංශයද? මහනායක හිමිවරුද? අස්ගිරි මල්වතු පාර්ශ්වද? මහා සංඝයා වහන්සේද? දියවඩන නිළමේද? බෞද්ධ සංවිධානද? ගිහි බෞද්ධයන්ද? දිවයින පුවත්පතද? මනෝජ් අබයදීර මහතාද? එසේත් නැත්නම් නෝර්වේ තානාපතිද? ඊනියා සටන් විරාම නිරීක්ෂණ කමිටුවද? මනෝජ් අබයදීර මහතාට ඇතැම් විට මේ සම්බන්ධයෙන් කීමට තවත් කරුණු තිබෙනවා විය හැකිය. ඒ මහතා තවත් ලිපියක් හෝ ලිපි කිහිපයක් ලිවීමට සිටිනවා විය හැකිය. නැතහොත් ඒ සම්බන්ධයෙන් තවත් ලිපි නොලියනවා විය හැකිය. ඒ කුමක් වුවත් මෙය කෙළවර වන්නේ කෙසේද? මේ රටේ කෙරෙන හෙළිදරවුවලට යන කල කුමක්ද? මෙරට හෙළිදරවු කොපමණ තිබේද යත් ඕනෑම හෙළිදරවුවක් ඉන්පසු එකතුවන හෙළිදරවුවලින් වැසී යයි.

අබයදීර මහතාගේ ලිපියේ ඇති කරුණු සම්බන්ධයෙන් කිසිවක් කීමට මට නොහැකිය. මම ඒ පිළිබඳව නොදනිමි. එහෙත් මට ඒ වටා කරුණු කිහිපයක් කිව හැකිය. පසුගිය උසස් පෙළ පරීක්ෂණයෙහි එක් සිංහල ප්‍රශ්න පත්‍රයක් සම්බන්ධයෙන් උද්ඝෝෂණයක් ඇති විය. ඒ ප්‍රශ්න පත්‍රය පිළිබඳව විභාග කොමසාරිස්වරයා නිගමනය කර ඇත්තේ අක්‍රමිකතාවක් නොවූ බවය. පරීක්ෂණයෙහි ප්‍රතිඵල ද දැන් නිකුත් වී ඇත. රහස් පොලිසියට අනුව ප්‍රශ්න පත්‍රය පිටවී නැති බව කියැවෙයි. ප්‍රශ්න පත්‍රයක ප්‍රශ්න ගණනාවක් ඒ ආකාරයෙන් නිවැරදිව කල්තබා කීමේ සම්භාවිතාව නම් ඉතා සුළු එකක් පමණක් බව කිව හැකිය. එහෙත් අවාසනාවකට එය සම්භාවිතාවක් පමණය. 0.0000000001 ක සම්භාවිතාවක් ඇති සිද්ධියක් වුවද සිදුවිය හැකිය. ලොතරැයියක් ඇදෙන්නට ඇති සම්භාවිතාව ඉතා සුළුය. එහෙත් කාහට හෝ ලොතරැයි ඇදෙයි. එහෙත් යමකුට අවුරුදු පතාම ලොතරැයි ඇදෙන්නේ නම් ලොතරැයි අදින්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රශ්න ඇතිවෙයි. සාමාන්‍ය නියැදිවලට බලපාන සම්භාවිතාවන්ට හසු නොවන, ප්‍රශ්න ගණනාවක්ම නිවැරදිව කීමට දක්ෂ ගුරුවරු සිටිත් නම් ඔවුන් අසාමාන්‍ය අති දක්ෂයන් විය යුතුය. පරීක්ෂකවරුන් අදක්ෂයන්වීමෙන් ද එවැනි තත්ත්වයක් උද්ගත වීමට හැකිය. අදක්ෂ ශිෂ්‍යයන් දක්ෂ ගුරුවරු වන්නේය යන්න අප සමග ඉගෙන ගත් අයකුගේ උපන්‍යාසයකි. විශ්වවිද්‍යාල පරීක්ෂණවලදී කොපි කර හසුවන ශිෂ්‍යයන් වඩාත් දක්ෂ ගුරුවරු වන්නේ දැයි නොදනිමි. කෙසේ වෙතත් ඒ සිංහල ප්‍රශ්න පත්‍රය ගැන දැන් කළ හැක්කේ ඉතිහාස ප්‍රශ්න පත්‍රයක ප්‍රශ්නයක් ඇසීමය. දළදා මාළිගාව සම්බන්ධ කතාවත් ඉතිහාසයට එක්වීමට ඇති ඉඩකඩ ඉතා විශාලය.

මනෝජ් අබයදීර මහතාට විරුද්ධව වෙනත් පුවත්පත්වල ඊනියා ප්‍රබුද්ධයන් ලිපි ලිවීම බලාපොරොත්තු විය හැකිය. ආගම්වාද ඇති කිරීම ගැන දිවයින ඉරිදා සංග්‍රහයට විරුද්ධවද බයිලා කීමට ඇතැම් සති අන්ත බයිලා සංග්‍රහ ඉදිරිපත් විය හැකිය. මේ බයිලා රාව සක්විත්තෝ අන් කවුරුවත් නොව සිංහල බෞද්ධ විරෝධීහු වෙති. ඔවුන්ගෙන් ඇතැමකු පටන්ගනු ඇත්තේම තමන් සිංහල බෞද්ධයන් යැයි කියමිනි. ඇතැමුන් තමන් කන්ද උඩරට බවද කියනු ඇත. මේ උප්පැන්න සහතිකවලින් අපට වැඩක් නැත. අප රටේ ප්‍රශ්නය වී ඇත්තේම උප්පැන්නේ සිංහල බෞද්ධයන් වැඩිවීමය. මොවුන්ගෙන් වැඩි දෙනෙක් ඕල්කට් බෞද්ධයෝ වෙති. ඕල්කට් බෞද්ධයන් රාජ්‍ය නොවන ආයතනවල මෙන්ම බෞද්ධ සංවිධානවලද දැකගත හැකිය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය පසගිය කාලයෙහි වෙසක් දිනය නිවඩු දිනයක් බවට සම්මත කර ගත්තේය. ඇතැමුන් මහත් ආඩම්බරයකින් ඒ ගැන කතා කළද, එය එතරම් වැඩකට ඇති දෙයක් නොවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි එවැනි තීරණයක් ගත්තද, එංගලන්තයේ හෝ ඇමරිකාවේ හෝ වෙනත් ක්‍රිස්තියානි රටක හෝ මුස්ලිම් රටක හෝ වෙසක් දිනය නිවාඩු දිනයක් බවට පත්කර නැත. එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉඳහිට බෞද්ධයන් හා වෙනත් ක්‍රිස්තියානි නොවන්නන් රවටන මෙවැනි තීරණ ගනියි. එවැනි තීරණවලට රැවටීමටද අපට පාසල්වල ඉගැන්වෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානය නමින් ඇති මේ බුෂ්ගේ සංවිධානය මොන තරම් හොඳ එකක් දැයි

© Prof. Nalin De Silva

පාසල්වල නුගැන්වේද? මේ කසිකබල් පාසල් අධ්‍යාපනය අවසානයේදී පැවැත්වෙන විභාගවලද රැවටීමක් නැත්නම් පුදුම විය යුතුය. එක්සත් ජාතීන් ඒ ප්‍රායෝගිකව වැදගැම්මක් නැති තීරණය ගත් අවස්ථාවේදී එයට පවා විරුද්ධ වූ එකම රට නෝර්වේ විය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඊනියා පහසුකම් සපයන්නා ලෙස ආරාධනය කළේද ද රනිල් වික්‍රමසිංහ මහතා දිගටම සිටින ලෙස කියන්නේද මේ ලූතර්වාදී ක්‍රිස්තියානි රටටය. කදිරගාමර් මහතාද නෝර්වේ රටට ආපසු යැමට යැයි කීමට සූදානම් නැත. එහෙත් ප්‍රශ්නය එය නොවේ. පසුගිය වෙසක් දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා භූමියේ පැවති උත්සවයේදී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ද ආරාධනයෙන් විදුලි පහන් දැල්වූවන් දෙදෙනාගෙන් එක් අයකු වූයේ නෝර්වේ නියෝජිතවරයාය. අනෙක් තැනැත්තා රනිල් වික්‍රමසිංහ මහතා විය.

මනෝජ් අබයදීර මහතා මතුකරන කතාවෙහි ඇත්ත නැත්ත කුමක් වුවද එය නොවිය හැක්කක් නොවේ. එයට හේතුව එය මෙරට සිදුවන ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි එක් කොටසක් විය හැකි බැවිනි. කිසියම් කෙනකු යුදෙව් හෝ වෙනත් ලෝක නිර්මාපක දෙවියන් වහන්සේ කෙනකු අදහගෙන ඒ පිළිබඳ භක්තියෙන් සිටීම ගැන කිසිම බෞද්ධයකුගේ විරුද්ධතාවක් නැත. බෞද්ධයනට අන්‍යාගම් ඉවසීමේ ඉතිහාසයක් ඇත. එහෙත් මේ රටේ ක්‍රියාත්මක වන ක්‍රිස්තියානි යටත්විජිතවාදී සංස්කෘතික ආක්‍රමණය පිළිබඳව කතා නොකර සිටිය නොහැකිය. අනෙක් රටවලද මේ ආක්‍රමණය සිදුවෙයි. මෙය පහළොස්වැනි සියවසේ අගභාගයේ පටන්ගත් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයේ එක් අංගයක් පමණකි. මේ යටත්විජිතවාදය ජගත් අධිරාජ්‍යවාදය ලෙසද හැඳින්විය හැකිය. අපි අනෙක් රටවල් මොහොතකට අමතක කර අපේ රට ගැන පමණක් සිත යොමු කරමු. දකුණු හා නැගෙනහිර ආසියාවේ මිනිස්සු සමස්තයක් ලෙස ගත්කල, තම ආගම මතය අනෙක් මිනිසුන් මත බලයෙන්, වංචාවෙන්, උපායෙන් ආදී වශයෙන් නොපැටවූහ. ඔවුහු අනෙක් අයගේ මත ඉවසූහ. මේ සාමාන්‍යයට යන්තමින් හෝ විරුද්ධ ව ගොස් ඇත්තේ ජපන් ජාතිකයන්ය. එයද ඉතා ටික කාලයකටය. අද බටහිරයන් හා මෙරට සිටින ඔවුන්ගේ දීන හෙංචයියන් මහත් උජාරුවෙන් කතා කරන වෝල්ටෙයාර් අන්‍යයන්ගේ මත ඉවසීම ඉගෙන ගෙන ඇත්තේ චීන ජාතිකයන්ගෙනි. මේ සියල්ල පිළිබඳ කෙටි විස්තරයක් මහාචාර්ය මීගස්කුඹුර මහතා විසින් පරිවර්ථනය කෙරී ඇති "පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි" නම් කෘතියෙහි සඳහන් වෙයි. අප කලකට පෙර සඳහන් කර ඇති පරිදි වෝල්ටෙයාර් අන්‍ය මත වෙනුවෙන් පෙනී සිටීම පිළිබඳ ප්‍රකාශය කරන්නට සිදුවූයේම එවකට බටහිර සංස්කෘතියෙහි අන්‍ය මත ඉවසීමක් නොතිබූ හෙයිනි. චීන ජාතිකයන්ගෙන් අන්‍ය මත ඉවසීම හා ඒවාට ගරු කිරීම ඉගෙන ගත් වෝල්ටෙයාර් බටහිර සභ්‍යත්වය තුළ එය අයිතියක් බවට පත් කෙළේය. ඊනියා අයිතිය හා අයිතිවාසිකම් සමස්තයක් ලෙස ගත්කල පෙරදිගට නුහුරුය. අප දන්නේ වගකීම් හා යුතුකම්ය. රජෙකු තම යුතුකම් ඉටු නොකරන විට ජනතාව නැගී සිටියහ. ජනතාව එසේ රජුට විරුද්ධ වූයේ ඒ යුතුකම් තම අයිතියක් ලෙස සලකමින් නොවේ. බුද්ධිමතුන් යැයි කියා ගන්නවුන්ට තේරුම් ගත නොහැකිය. ඔවුන්ට අයිතිය, අයිතිවාසිකම් ආදී ක්‍රිස්තියානි සංකල්පවලින් බාහිරව සිතීමට නොහැකිය. මේ කසිකබල් සංකල්පයේ ප්‍රතිඵලයක් ලෙස අද බටහිර පවුල් ඒකකය කඩා වැටෙමින් ඇත්තේ ස්වාමියාගේ අයිතිය, භාර්යාවගේ අයිතිය. දෙමව්පියන්ගේ අයිතිය, දරුවන්ගේ අයිතිය ආදිය අතර පවත්නා ආතති, ඝර්ෂණ හා ගැටුම් (ක්‍රිස්තියානි නිව්ටෝනීය සංකල්ප - වැඩි විස්තර සඳහා විදුසර ලිපි කියවන්න) හේතුකොට ගෙනය.

වෝල්ටෙයාර් කුමක් කියා තිබුනේද බටහිර සංස්කෘතීන්හි අන්‍ය මතවලට ගරු කිරීමක් දක්නට නොමැතිය. ඒ ඒ රටවල ව්‍යවස්ථාවල එවැනි වගන්ති තිබෙන බව එකකි. එහෙත් ඒ වලංගු වන්නේ ඒ රටේ අධිපතිවාදී සංස්කෘතියේ අය සඳහා පමණය. සමස්තයක් ලෙස ගත් කල අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම බටහිරයන් මුනිච්චාවට කියන කතාවක් පමණි. තම ආගම, සංස්කෘතිය ලෝ පුරා පැතිරවීම පෙරදැරි කරගෙන අන්‍ය ආගම් සංස්කෘතීන් මැŽම සඳහා යුද්ධ කළෝ බටහිර ආසියාවෙන් පැන නැගුණු ආගම් වල ජනතාවය. මෙය යුදෙව් පරණ තෙස්තමේන්තුවෙන් ගලා එන්නකි. ක්‍රිස්තුස්වහන්සේ යම් ප්‍රමාණයකට මෙය වෙනස් කිරීමට උත්සාහ කළද එය සාර්ථක නොවීය. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි වඩා ඇත්තේ යුදෙව් මතය. විශේෂයෙන්ම 1517 දී ඇරඹුණු ලූතර්වාදී ප්‍රතිසංස්කරණ සමඟ ක්‍රිස්තියානි සංස්කෘතියෙහි යුදෙව් චින්තනය වඩාත් බලවත් විය. ලූතර්වාදය බිහිවූයේ බොහෝ කරුණුවලින් කතෝලික චින්තනයේ සිට යුදෙව් චින්තනය දක්වා ආපසු යැමෙනි. ඒ සමඟ ග්‍රීක චින්තනයෙන්ද යම් යම් දෑ ලබා ගැනිණි. එහි ප්‍රතිඵලයක් ලෙස බිහිවූ චින්තනයට අපි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය යැයි කියමු. එදා සිට අද දක්වාම බටහිරයෝ මොන වෝල්ටෙයාර් බයිලා කිවුවත් විවිධ ක්‍රම හරහා තම සංස්කෘතිය පතුරවති. එහිදී අන්‍ය සංස්කෘතීන් හැකි නම් නැති කර දමති.

© Prof. Nalin De Silva

1505 සිට අද දක්වාම මෙරට කෙරෙන්නේ බටහිර සභ්‍යත්වය අප මත බලයෙන්, උපායෙන්, අක්‍රමික අයුරින් ආදී වශයෙන් පැතිරවීමය. එහිදී ආගම ප්‍රචාරය කිරීම එක් අංගයක් පමණකි. ආගමටද වඩා මෙහිදී බලපාන්නේ සංස්කෘතිය, සිංහල කතෝලික බැතිමතකුට බටහිර සංස්කෘතියක නොඉඳ සිංහල බෞද්ධ සංස්කෘතියක ජීවත්වීමට හැකි විය යුතුය. එහෙත් සිංහලයන් හෝ වෙනත් අය හෝ ක්‍රිස්තියානි ආගම්වලට හැර වූ පසු ඔවුන්ගේ සංස්කෘතියද වෙනස් කෙරෙයි. මේ පරණ තෙස්තමේන්තුව මත පදනම් වන ආගම්වල දක්නට ඇති ලකෂණයකි. බුදුදහම ආසියාව පුරා එකල පැතිර ගියේය. ඒ ඒ රටවල තිබූ සංස්කෘතීන්ට අනුගත වෙමිනි. ලංකාවේ සිංහල බුද්ධාගමක්ද, චීනයේ කුන්ෆියුෂියස් - ටාඕ දහම් මිශ්‍ර වූ චීන බුද්ධාගමක්ද, ජපානයේ ෂින්ටෝ දහම් සමඟ බද්ධ ව බුද්ධාගමක්ද ඇත්තේ එබැවිනි. එහෙත් ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම් එසේ නොවේ. ඒ ඒ ක්‍රිස්තියානි නිකාය අතර වෙනස්කම් තිබුණද, යම් ක්‍රිස්තියානි නිකායක් ගත් කල එයට අයත් වුවෝ ලෝකයේ කොහේ සිටියද එක් මධ්‍යස්ථානයකින් මෙහෙයවෙති. ක්‍රිස්තියානි ආගම වැළඳ ගැනීම යනු බොහෝ විට තම රටේ සංස්කෘතියට විරුද්ධව යැමක්ද විය. එසේ ක්‍රිස්තියානි වුවත් විජාතික මධ්‍යස්ථාන මගින් මෙහෙයවනු ලැබූ බැවින් ජාතික නිදහස සම්බන්ධයෙන් ගැටළු පැන නැගිණි. ක්‍රිස්තියානි ආගම්වලට නොව ක්‍රිස්තියානි සංස්කෘතීන්ට විරුද්ධ වීම ජාතික නිදහස් සටන්වල එක් අංගයක් වන්නේ ක්‍රිස්තියානි සංස්කෘතීන් ජාතික නිදහසට එරෙහිව යන බැවිනි.

දහනමවැනි සියවසේ අග මෙරට පැන නැගි බෞද්ධ ප්‍රබෝධය හුදු බෞද්ධ ප්‍රබෝධයක් නොවීය. එය සිංහල බෞද්ධ සංස්කෘතික ප්‍රබෝධයක් විය. එය ඉංගිරිසි ක්‍රිස්තියානි (ඇංග්ලිකන් පමණක් නොව එංගලන්තයේ ජීවත් වූ වෙස්ලි නම් පූජක තැන ඇරඹි මෙතෝදිස්ත සභාවද ඇතුළු) ආර්ථික, සංස්කෘතික හා දේශපාලන යටත්විජිතවාදයට එරෙහිව කෙරුණු අරගලයක් විය. අවුරුදු එකසිය තිහකට හතළිහකට පෙර මෙරට යටත් විජිත විරෝධී අරගලය ප්‍රධාන වශයෙන්ම ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදී සංරචකයන්ට එරෙහිව කළ එකක් විය. මේ අරගලය සංකේතවත් වන්නේ පාණදුරාවාදය ප්‍රමුඛ පංච මහා වාදවලිනි.

තව දින කිහිපයකින් පළමු පාණදුරා වාදයට අවුරුදු එකසිය තිහක් පිරෙන බැවින් ඒ සම්බන්ධයෙන් ද වචන කිහිපයක් කිව යුතු වෙයි. ඒ පිළිබඳව උත්සවයක් පැවැත්වෙන බවටද ශාස්ත්‍රීය ග්‍රන්ථයක් හා සමරු මුද්දරයක් නිකුත් කෙරෙන බවටද, ආරංචියක් ද වෙයි. ඒ උත්සවයේ සංවිධායකයන්ද ඇතුළු බොහෝ දෙනකු ඇතැම් විට නොදැන සිටියද අවුරුදු කිහිපයක සිට අපි කිහිප දෙනෙක් දෙවැනි පාණදුරා වාදයක් කරගෙන යන්නෙමු. ඒ දෙවැනි විවාදයෙන්ද අපි දැනටමත් ජය ලබා ඇත්තෙමු. පාණදුරේ ජන්ම ලාභය ලැබූවකු ලෙස මට ඒ ගැන ඇත්තේ අභිමානයකි. එහෙත් පළමු විවාදයෙහිදී මෙන්ම ඒ ජය දේශපාලන කෙෂ්ත්‍රයටද ගෙන යන්නේ කෙසේද යන ප්‍රශ්නයට අපි මුහුණපා සිටිමු. අනගාරික ධර්මපාලතුමාගේ කාලයේ පටන්ම අවුරුදු එකසියතිහක් තිස්සේ අපට විසඳාගත නොහැකි වූ එක් ප්‍රශ්නයක් එය වෙයි. මේ ප්‍රශ්නයට විසඳුමක් නැති වීමෙහි එක් ප්‍රතිඵලයක් ලෙස එදා බ්‍රිතානි ක්‍රිස්තියානි ආණ්ඩුවද ඇතුළු විජාතික බලවේගවලට, ජාතික ව්‍යාපාරයෙහි යෙදී සිටියවුන් පිරිසක්ද එකතු කරගනිමින් ධර්මපාලතුමාටත් ගුණානන්ද හිමියන්ටත් පහර දීමට හැකිවිය. ජාතික ව්‍යාපාරයෙන්ද කොන්කරනු ලැබූ ධර්මපාලතුමා අවසානයේදී කලකිරී අපවත් වූයේ නැවත ලංකාවේ නුපදීම්වා යන පැතුමෙනි.

මෙයට හේතු කවරේදැයි විටින් විට ලියා ඇති මුත් නැවතත් සඳහන් කිරීමෙහි වරදක් ඇතැයි නොසිතමි. එහෙත් එයට කලින් කරුණු කිහිපයක් කිව යුතුය. පාණදුරා වාදය සැමරීම නිමිත්තෙන් රජය සමරු මුද්දරයක් නිකුත් කිරීමට යන බව සැළය. ඒ උත්සවයේ මුලසුනට අස්ගිරි මහනායක හිමියන් වඩින බවද සැළය. පාණදුරා වාදය හා රජයත් අස්ගිරි මහනායක හිමියනුත් අතර ඇති සම්බන්ධය කුමක්ද? පාණදුරා වාදයෙහි හරය තේරුම් ගන්නේ නම් මේ ආණ්ඩුවේ කිසිම මැති ඇමැතිවරයකුට ඒ වාදය සැමරීම සඳහා ආරාධනා නොකළ යුතුය. මුද්දරයක් නිකුත් නොකළාට පාණදුරා වාදයට ලැබී ඇති ඓතිහාසික වැදගත්කමට අබමල් රේණුවක් හෝ පාඩුවක් නොසිදු වෙයි. එහෙත් පාණදුරා වාදය වෙනුවෙන් මුද්දරයක් නිකුත් කිරීමෙන් ආණ්ඩුවට තම පව් සෝදාගැනීමේ අවස්ථාවක් ලැබෙයි. (පව් සෝදා ගැනීමද ක්‍රිස්තියානි සංකල්පයකි) පාණදුරාවාදය බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට එරෙහිව කරන ලද්දකි. එහෙත් මේ ආණ්ඩුව ගැන කිව හැක්කේ කුමක්ද? පාණදුරාවාදය සැමරීමෙන් කුමක් බලාපොරොත්තු වන්නේදැයි මම නොදනිමි. ආණ්ඩුව සහභාගි කරගනිමින් කරන සැමරීමකින් තවත් සිංහල බෞද්ධ ප්‍රබෝධයක්, ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදය ඇතුළු සමස්ත යටත්විජිතවාදයට ම විරුද්ධ නැගිටීමක් නම් බලාපොරොත්තු විය නොහැකිය. අඩුම තරමින් මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමියන්ට කෙළෙහි ගුණ දැක්වීමවත්

© Prof. Nalin De Silva

කළ නොහැකිය. මේ ආණ්ඩුව සංස්කෘතිකව ගත් කල ක්‍රිස්තියානි වෙයි. ආණ්ඩුව තුළ ක්‍රිස්තියානි කෙතරම් බලවත්ද යතහොත් අද ක්‍රිස්තියානි ඇමැතිවරුන් අතර තරගයක්, බෙලි කපා ගැනීමක් ඇති වී තිබේ. ජෝන් අමරතුංග හා ජයලත් ජයවර්ධන ඇමැතිවරු අද එකිනෙකා සමග ප්‍රසිද්ධියේ සටන් වදිති. ආණ්ඩුව මුළුමනින්ම රට බෙදන ක්‍රිස්තියානි දෙමළ ජාතිවාදයට පක්ෂපාත ලුතර්වාදී නෝර්වේ රටට යටවී ඇත. නෝර්වේ පිටුපස ඇත්තේ ක්‍රිස්තියානි බ්‍රිතානිය හා ඇමරිකාවය. පාණ්දුරාවාදය සැමරීමට මේ ආණ්ඩුවේ මැදිහත් වීමෙන් නිකුත් කෙරෙන සමරු මුද්දරයේ විකුණුම් මිල කොපමණ වුවත් එහි සත පහක වටිනාකමක් නැත.

**(මතු සම්බන්ධයි)**

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva